නොගැලපෙන රෝද

වි. සුතේයෙව්

වි. සුතේයෙව්

නොගැලපෙන රෝද

අනුවාදය
පද්ම හර්ෂ කුරණගේ

Kanol

නොගැලපෙන රෝද

කතාව සහ චිත්‍ර
වි. සුතේයෙව්

අනුවාදය
පද්ම හර්ෂ කුරණගේ

නව සකැසුම
මාලක ලලනජීව

ISBN 978-955-1979-17-1

ප්‍රකාශනය
කැනොල් පබ්ලිෂිං හවුස්

මුද්‍රණය
රොනැට් එන්ටප්‍රයිසස්

ප්‍රථම මුද්‍රණය 2011

මැස්සෙකුයි, ගෙම්බෙකුයි, ඉත්තෑවෙකුයි, කුකුළෙකුයි ගස් කොටයක් උඩ ගෙයක් හදා ගෙන උන්නා.

මැස්සගෙ නම රුංරුං පැංචා. ගෙම්බගෙ නම බක බක අප්පුහාමි. ඉත්තෑවගෙ නම ඉඳිකටු මුදියන්සෙ. කුකුළාගෙ නම හඬලන රාළ.

දවසක් දා මේ හතරදෙනා කැලෑවක් මැදින් ගමනක් ගියා. හතු, මල්, ගෙඩි ජාති, දර එකතු කරන්න. රුංරුං පැංචා යාළුවො තුන් දෙනාගෙ ඔලු උඩින් පියාසර කෙරුවා.



ඉතිං ඔහොම ගිහින් ගිහින් මේ හතර දෙනාම ගස් කොළං නැති පාළු පිට්ටනියකට ආවා. එතන පුංචි කරත්තයක් තිබෙනවා දැක්කා. කරත්තෙට සවි කරල තිබුණෙ එකට එක නොගැලපෙන රෝද. පළමුවෙනි රෝදෙ බොහොම කුඩා එකක්. දෙවෙනි රෝදෙ තරමක් ලොකුයි. තුන්වෙනි රෝදෙ ඊට ලොකුයි. හතරවෙනි රෝදෙ මහ විසාලයි.

යාලුවො පුදුම වෙලා කරත්තෙ දිහා බලාගෙන ඉන්නකොට, ළඟ තිබුණ පඳුරකින් හාවෙක් එළියට පැන්නා. එයත් කරත්තෙ දිහා බලලා හිනාවෙනවා. හාවාගෙ නම පිනුම් හාමි.



"මේ කරත්තෙ ඔයාගෙ ද?" කියල යාලුවො හතර දෙනා පිනුම් හාමිගෙන් ඇහුවා.

"නෑ. ඒක වලස් හාමිගෙ කරත්තෙ. වලස් හාමි ඔය කරත්තෙ හදන්න බොහොම මහන්සි ගත්තා. නමුත් එයාට ඒක හදාල ඉවරකරන්ට බැරි වුණා" කියල පිනුම් හාමි කිව්වා.

"මේ කරත්තෙන් වැඩක් ගන්ට පුළුවන්. ඒ හින්ද අපි මේක ගෙදර ගෙනියමු" කියලා ඉත්තෑහාමි කිව්වා.

"හොඳයි, හොඳයි" කියලා ඒ අදහසට අනිත් යාලුවො තුන්දෙනාම කැමති වුණා.

ඒ හතර දෙනාම එකතු වෙලා කරත්තෙ තල්ලු කරන්න පටන් ගත්තා. රෝද එකට එක ගැලපෙන්නෙ නැති හින්ද කරත්තෙ පොඩ්ඩක්වත් හෙල්ලුනේ නෑ.



තල්ලු කළාට මොකද පාරපුරා
ගස් මුල්වල හැපී කරත්තෙ ඒ අත
මේ අත පෙරළුණා මිසක් ඉදිරියට
ගියේ නෑ.

අහකට වෙලා බලාගෙන හිටිය පිනුම් හාමි හති වැටෙන තුරු හිනා වුණා. කරත්තෙ තල්ලු කරපු යාළුවො හතරදෙනාට හොඳටම මහන්සියි.

"අපි එක එක්කෙනා එක එක රෝදය ගෙදර ගෙනියමු" කියලා ඉඳිකටු මුදියන්සෙ කිව්වා.

හතරදෙනාම ඒකට කැමති වෙලා එක එක රෝදය ගත්තා. රැංරැං පැංචා ඉතාම කුඩා රෝදය පෙරලන්ට පටන් ගත්තා. ඉඳිකටු මුදියන්සෙ ඊළඟ රෝදය පෙරළන්ට පටන් ගත්තා. බක බක අප්පුහාමි තරමක් ලොකු රෝදය පෙරළන්ට පටන් ගත්තා. බක බක අප්පුහාමි තරමක් ලොකු රෝදය පෙරලාගෙන ගෙදර ගියා.

"මේ ගොල්ලො හරි පුදුම මිනිස්සු. එකට ගැළපෙන්නෙ නැති රෝද ගෙදර ගෙනියනවා" කියලා පිනුම් හාමි කිව්වා. ඊට පස්සෙ පිනුම් හාමි පඳුරු අස්සට පැනලා යන්ට ගියා.

රූංරූං පැංචයි, ඉඳිකටු මුදියන්සෙයි, බක බක අප්පුහාමියි, හඬලන රාළයි රෝද හතර ගෙදර ගෙනාවා. රෝදවලින් වැඩක් ගන්නේ කොහොමදැයි කියලා හතර දෙනාම කල්පනා කරන්ට පටන් ගත්තා.

"මම දන්නවා වැඩක් ගන්න හැටි" කියලා රූංරූං පැංචා කිව්වා. එයා ඉතාම කුඩා රෝදයෙන් නූල් කටින යන්තරයක් හදා ගත්තා.

ඉඳිකටු මුදියන්සෙ එයා ගෙනා රෝදයට ලී පටි දෙකක් සවි කරගෙන තනි රෝදෙ අත් කරත්තයක් හදා ගත්තා.

"මටත් පුළුවනි මගේ රෝදයෙන් වැඩක් ගන්න" කියලා බක බක අප්පුහාමි කිව්වා. රෝදය ළිඳට උඩින් සවිකරල බක බක අප්පුහාමි ලෙහෙසියෙන් වතුර අදින්ට පටන් ගත්තා.

වේගයෙන් ගලා යන දිය පාරකට අහුවෙලා කැරකැවෙන්න රෝදය සවිකර ගත්තු හඬලන රාළට පුළුවන් වුණා ජල බලයෙන් වැඩ කරන මෝලක් හදා ගන්ට.

මේ විදියට සියලුම රෝදවලින් වැඩ ගන්ට පුළුවන් වුණා.

රූංරූං පැංචා නූල් කටින යන්තරයෙන් නූල් ඇඹරුවා. බක බක අප්පුහාමි ළිඳෙන් වතුර ගෙනැවිත් වත්තෙ එළවළු කොටුවට දැම්මා. ඉඳිකටු මුදියන්සෙ කැලේට ගිහිල්ලා පලතුරු සහ දර කඩාගෙන ඒවා තනි රෝදෙ අත්කරත්තෙ පටවාගෙන ආවා. හඬලන රාළ එයාගෙ මොලෙ පිටි අඹරන්ට පටන් ගත්තා.

යාළුවො හතර දෙනාගෙ සැපදුක් දැනගන්න දවසක් පිනුම් හාමි ඒ ගොල්ලන්ගෙ ගෙදරට ආවා.

යාළුවෝ හතර දෙනා පිනුම් හාමි දැකලා බොහොම සන්තෝස වුණා. රෑංරෑං පැංචා පිනුම් හාමිට අත්මේස් කුට්ටමක් දුන්නා. බක බක අප්පුහාමි ලොකු කැරට් අලයක් දුන්නා. ඉඳිකටු මුදියන්සෙ ඇපල් ගෙඩියක් දුන්නා. හඬලන රාළ රස කැවිලියි පාන් ගෙඩියකුයි දුන්නා.

එදා රෝද ගෙනියනකොට හිනාවෙච්ච නිසා පිනුම් හාමිට ලැජ්ජා හිතුණා.

"මට සමාවෙන්න. රෝද එකට එක ගැළපෙන ඒවා නොවුණත් ඒවා පාවිච්චි කරන සැටි දන්න අය ඉන්නවනම් වැඩ ගන්න පුළුවන් විත්තිය දැන් මට පේනවා" කියලා පිනුම් හාමි කිව්වා.

Kanol Publishing House
119/4, Kottawa Road, Pannipitiya
Tel: 011 4336778, 011 4336779

ISBN 978-955-1979-17-1
Rs. 80/-
9 789551 979171